සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved.*

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

# පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

**නම/ විභාග අංකය:**

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01 නීතිය යනු රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ............................ හා යුතුකම් සමුදායකි.
(1) අයිතිවාසිකම් (2) රීතීන් (3) අණපනත් (4) චක්‍රලේඛන

02 යුක්තිය තුළ අන්තර්ගත කරුණු 2 නම්,
(1) යුතුකම් හා අයිතිවාසිකම් (2) සත්‍යය හා සදාචාරය
(3) නීතිය හා අවනීතිය (4) අධිකරණ තීන්දු හා පනත්

03 සිවිල් නීතියට උදාහරණ නම්,
(1) ගිවිසුම් හා අයිතිවාසිකම් (2) මිනීමැරුම්
(3) මංකොල්ලකෑම් (4) සොරකම

04 යාපනේ චාරිත්‍රමය නීති ඇතුළත් නීතිය
(1) උඩරට නීතිය (2) තේසවලාමෙයි නීතිය
(3) දමිළ නීතිය (4) මුස්ලිම් නීතිය

05 රාජ්‍ය නීතිය හා සම්බන්ධ ප්‍රධාන භූමිකාවක් නොවන්නේ,
(1) අධිකරණ අමාත්‍ය තුමා (2) අග්‍රවිනිශ්චයකාර තුමා
(3) නීතිපති තුමා (4) නීති උපදේශක මහතා

06 අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කර දීමට ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රතිපාදන සලසා දී තිබේ. එම වගන්ති වන්නේ,
(1) 4 - 5 (2) 10 - 12 (3) 100 - 102 (4) 107 - 117

07 විනිශ්චයකාරවරුන් පත්කරනු ලබන්නේ,
(1) නීතිපතිතුමා විසින් (2) ජනාධිපතිතුමා විසින්
(3) අගමැතිතුමා විසින් (4) අගවිනිසුරුතුමා විසින්

08 ශ්‍රී ලංකාවේ සිදුවන අපරාධ පිළිබඳ අධිකරණ බලය හිමිව ඇත්තේ,
(1) ශ්‍රේෂ්ඨාධිකරණයට (2) අභියාචනාධිකරණයට
(3) මහාධිකරණයට (4) සුප්‍රීම් උසාවියට

09 දිසා අධිකරණයකින් තීන්දු දිය නොහැකි නඩු වර්ගයක් වන්නේ,
(1) දික්කසාද නඩු (2) ස්ත්‍රී දූෂණ (3) බෙදුම් නඩු (4) මිනී මැරුම්

10 කාති උසාවිය කරන ලද කාර්යයක් වන්නේ,
(1) කම්කරු ප්‍රශ්න විසඳීම. (2) මුස්ලිම් විවාහ සම්බන්ධ ගැටළු විසඳීම.
(3) ගෙවල් කුලී පනත ක්‍රියාත්මක කිරීම. (4) දෙමළ ජනතාවගේ ගැටළු විසඳීම.

11 1994 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව සිය දුක් ගැනවිලි සෘජුවම ඉදිරිපත් කළ හැක්කේ කාහටද?
(1) ජනාධිපතිවරයාට (2) නීතිපතිතුමාට
(3) ඔම්බුඩ්ස්මන්වරයාට (4) අධිකරණ ඇමතිතුමාට

12 බටහිර ජාතීන්ගේ පාලන සමයේ දී ශ්‍රී ලංකාවේ පැවැති පාලන ඒකකයක් නොවන්නේ,
(1) ගම්සභාව (2) දිසාව (3) කෝරළ (4) පත්තු

13 නැගෙනහිර පළාතට අයත් දිස්ත්‍රික්කයක් නොවන්නේ,
(1) මඩකලපුව (2) වව්නියාව (3) අම්පාර (4) ත්‍රිකුණාමලය

14 ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක ගණන කීයද?
(1) 24 (2) 23 (3) 25 (4) 09

15 දිස්ත්‍රික්ක පරිපාලන නිලධාරියා වන්නේ,
(1) ප්‍රාදේශීය ලේකම් තුමා (2) දිසා විනිසුරු තුමා
(3) දිස්ත්‍රික් ලේකම් තුමා (4) ග්‍රාම නිලධාරි තුමා

16 නීති පැනවීම කුමන කාර්යයක් ද?
(1) අධිකරණ කාර්යයක් (2) ව්‍යවස්ථාදායක කාර්යයක්
(3) විධායක කාර්යයක් (4) නීතිපතිතුමාගේ කාර්යයක්

17 සම්පූර්ණ හෝ කොන්දේසි සහිත සමාවදීමේ බලය ඇත්තේ,

(1) ජනාධිපතිවරයාට (2) අගමැතිවරයාට

(3) නීතිපතිවරයාට (4) අධිකරණ ඇමතිතුමාට

18 අධිකරණයේ කාර්යයක් නොවන්නේ,

(1) නීති පැනවීම (2) නීතිය විවරණය කිරීම

(3) නඩු විනිශ්චය කිරීම (4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරදීම

19 පළාත් සභා සංචෘත්ත ලැයිස්තුවට හිමි බලයක් නොවන්නේ,

(1) රාජ්‍ය ආරක්ෂාව (2) විදේශ කටයුතු

(3) ජාතික ප්‍රවාහනය (4) දේශීය වෛද්‍ය කටයුතු

20 පළාත් පාලන ආයතනවලට පොදුවේ පැවරෙන කාර්යයක් නොවන්නේ,

(1) අධ්‍යාපනය (2) පොදු මංමාවත්

(3) මහජන සෞඛ්‍යය (4) මහජන උපයෝගීතා සේවා

21 පළමුවරට බටහිර දේශපාලන ආයතන මෙරට ස්ථාපිත කළේ,

(1) 1910 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයෙනි. (2) 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණයෙනි.

(3) 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණයෙනි. (4) 1972 පළමු ජනරජ ව්‍යවස්ථාවෙනි.

22 යහපාලනයේ ගුණාංගයක් නොවන්නේ,

(1) බඩු මිල අඩු කිරීම (2) කාර්යක්ෂමතාව හා ඵලදායිතාව

(3) සමානාත්මතාව (4) තිරසාර බව

23 වගවීම යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) තමාට පැවරෙන කාර්යය (2) වගකීම ඉටුකිරීම සම්බන්ධයෙන් වූ බැඳීම

(3) සියලු දේ විනාශ වී යෑම (4) වගකීම් බෙදියෑම

24 පළාත් සභා ක්‍රමය ස්ථාපිත වූයේ 1978 ව්‍යවස්ථාවට ගෙන එන ලද කීවෙනි සංශෝධනයෙන් ද?

(1) 15 වෙනි (2) 4 වෙනි (3) 9 වෙනි (4) 13 වෙනි

25 සිඩෝ (CEDAW) සම්මුතිය කවුරුන් වෙනුවෙන් පෙනී සිටින සම්මුතියක් ද?

(1) ළමුන් වෙනුවෙන් (2) සියලු මිනිස් අයිතිවාසිකම් වෙනුවෙන්

(3) කාන්තාවන් වෙනුවෙන් (4) විදේශ සංක්‍රමණිකයන් වෙනුවෙන්

(2 x 25 = 50)

## II කොටස

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01 නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ.

(1) නීතිය සඳහා නිර්වචනයක් ඉදිරිපත් කරන්න. ( ල .02)

(2) නීතිය හා යුක්තිය අතර වෙනස්කම් 3 ක් ලියන්න. (ල. 03)

(3) නීතියේ මූලාශ්‍ර 5 ක් විස්තර කරන්න. (ල. 05)

02 (1) දේශීය නීතියේ පවතින ප්‍රභේද වර්ග කීයද? ඒ මොනවා ද? (ල. 02)

(2) ඉන් එකක් මගින් විභාග කරන කාර්යයන් 3 ක් ලියන්න. (ල. 03)

(3) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීති වර්ග 2 ක් විස්තර කරන්න. (ල. 05)

03 (1) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධිකරණ ආයතන 05 ක් නම් කරන්න. (ල. 02)

(2) ඉන් ඉහළම අධිකරණය නම්කර ඒ සතු අධිකරණ බලයන් 5 ක් ලියන්න. (ල. 03)

(3) බේරුම්කරණය යන්න විස්තර කරන්න. (ල. 05)

04 (1) ශ්‍රී ලංකාවේ පළාත් කීයද? ඒවා නම් කරන්න. ( ල . 02)

(2) මධ්‍යම ආණ්ඩුවේ ප්‍රධාන පාලන කොටස් කීයද? ඒවා මොනවා ද? (ල.

(5 x 10 = 50)